**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව - 2022**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය, මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සහා අරමුදල් මඟින් ඉටුකළ ව්‍යාපෘති 04 ක වටිනාකම රු.1,795,636 ක් වුවත් ණයහිමි ලෙස රු.1,685,221 ක් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් රු.110,415 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සහා අරමුදල් මඟින් ක්‍රියාත්මක කළ වලව්වත්ත 06 වන පටුමග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ ණයහිමියන් රු.399,998 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ දක්වා තිබූ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිපාදන රු.25,497,023 ක් වටිනා කර්මාන්ත 30 ක් ක්‍රියාත්මක කර නොතිබියදී එම කර්මාන්ත ණයගැති හා ණයහිමි ලෙස ගිණුම්ගත කිරීමෙන් වූ අඩුපාඩුව සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කොම්පෝස්ට් නිෂ්පාදන ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියේ ණයගැතියන් සහ ණයහිමියන් රු.173,544 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන් හා ණයගැතියන් තහවුරු කර ගැනීමෙන් තොරව ගිණුම්ගත කිරීම නිසා රු.28,054,179 කින් ණයහිමියන් හා ණයගැතියන් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.9,878,350 ක් වටිනා සභාවේ ගලිබවුසරය ගිණුම්ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් වෙන්දේසි වලින් පොදු කටයුතු සඳහා සභාව වෙත ලැබුණු ඉඩම් කොටස් 02 ක වටිනාකම වූ රු.11,270,750 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් එකතුව රු.316,800 ක් වටිනා LED මොනිටර් 03 ක් හා Canon ප්‍රින්ටර් 03 ක් වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු.600,000 ක පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | පුස්තකාල 05 හි තොරතුරු 2023 භාණ්ඩ සමීක්ෂණයට ඇතුළත් කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 4,485,511ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.1,333,072 ක වෙනසක් විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනසට හේතු සොයා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7** අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - මු.රෙ. 104 (3) | සභාවේ JCB යන්ත්‍රයේ 2022 ඔක්තෝබර් 13 වන දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී එවැනි අනතුරක් සිදු වුවහොත් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරිමට පියවර ගන්නා බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,796,101 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,232,056 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ පොදු බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂය පුරාවට රුපියල් මිලියන 15 කට වැඩි සාමාන්‍ය ශේෂයක් රඳවා තබා ගැනීම නිසා ඉහළ ප්‍රතිලාභ ලැබිය හැකි ස්ථාවර තැන්පත් වැනි ආයෝජන මූලාශ්‍රයක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ මුදල් ස්ථාවර තැන්පත් ලෙස තැන්පත් කිරිමට මහා සභාවේ අනුමැතිය එවකට නොලැබුණු අතර වර්තමානයේ දී මුදලක් ස්ථාවර තැන්පත් කිරීමට තීරණ හා කළමනාකරණ කමිටුවේ තීරණය ලැබී ඇති බව. | සභාවේ අතිරික්ත මුදලක් පවතීනම් සභාවට ඉහළ ප්‍රතිලාභ ලැබෙන සුරක්ෂිත මූලාශ්‍රයක ආයෝජනය කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 4,024 | 4,024 | 5,114 | 6,376 | 4,024 | 3,745 | 1,614 | 9,597 |
| කුලී | 11,300 | 11,783 | 12,856 | 3,396 | 12,300 | 9,127 | 6,685 | 4,850 |
| බලපත්‍ර ගාස්තු | 2,200 | 2,179 | 2,179 | - | 1,235 | - | - | - |
| වෙනත් ආදායම් | 11,315 | 9,550 | 67,046 | 28,652 | 158,438 | 140,252 | 76,438 | 149,590 |
| එකතුව | 28,839 | 27,536 | 87,195 | 38,424 | 175,997 | 153,124 | 84,737 | 164,037 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති වරිපනම් රු.6,960,588 ක හිඟයෙන් රු.4,309,193 ක මුදලක්ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,024,359 ක බිල්කිරීමෙන් රු.1,772,362 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු සම්බන්ධව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධි විධාන අනුව කඩිනමින් හිඟ මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.802,518 ක හිඟය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අක්කර බදු ලේඛනයේ නම පමණක් සඳහන්ව ඇති නිසා එම දේපල හඳුනා ගැනීමට නොහැකි බව. | -එම- |

**කුලී**

| | | | |
|---|---|---|---|
| (අ) | මැල්සිරිපුර කඩ කාමර 2013 වර්ෂයේ ටෙන්ඩර් කර දී තිබුණද 2019 වර්ෂය තෙක් කඩ කාමර තක්සේරු කර කඩකුලී අය කිරීමට කටයුතු කර නොතිබුණි. 2019 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කඩ කාමර මාසික කුලිය තක්සේරු කර තිබූ අතර එම මාසික තක්සේරුව අනුව කඩ කාමර 10 න් 2022 වර්ෂයට රු.3,763,596 ක හිඟ කඩ කාමර කුලී අයකර ගැනීමට පැවතුණි. | වයඹ පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කර එතුමාගේ උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | ටෙන්ඩර් කැඳවා බදු දී තිබේ නම් බදු මුදල අයකරගත යුතුය. |
| (ආ) | වත්කම් බදු දීම තුළින් 1996 වර්ෂයේ සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ වත්කම් ඒකක 24 කින් රු.1,711,276 ක ශේෂයක් අයකර ගැනීමට පැවතුණි. | වත්කම් බදු දීම තුලින් අයවිය යුතු දේපල 24න් දේපල 2ක් සඳහා නඩු පවරා ඇති අතර හිරිපිටිය අංක 02 මාලු වෙළඳසැලෙන් අයවිය යුතු රු. 16,100 ක මුදලක් මේ වන විට අයකර ඇති බව. | වත්කම් බදු දීමෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් හා ගොඩනැගිලි 11 ක් සමාලෝචිත වර්ෂය වන විටත් තක්සේරු නොකිරීම නිසා ගිණුම්ගත කර නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම සකසන විට අදාල දේපල තක්සේරු වටිනාකම් සිදුකර ඇතුළත් කරන බව. | තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 අත්හැර දැමූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය ප්‍රතිපාදන මත පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (පුර නැගුම) මඟින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පූර්ණ සහභාගීත්වයෙන් සභා බල ප්‍රදේශයේ පානීය ජලයේ අවශ්‍යතාවය ඇති ග්‍රාම නිලධාරී වසම් 12 ක් සඳහා විකල්ප ජල ප්‍රභවයක් වශයෙන් ලීටර් 5,000 හා ලීටර් 2,000 ධාරිතාවෙන් යුතු ජල ටැංකි 73 ක් ස්ථාපිත කර ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි. මෙම ජල ටැංකි ස්ථාපනය කිරීම 2018 වර්ෂයේදී සිදුකළ අතර ජලය බෙදා හැරීමට අවශ්‍ය ජල බවුසර 03 ලබාදෙන ලද්දේ 2021 වර්ෂයේදීය. වෙනත් ජල සැපයුම් ප්‍රභවයන්ගෙන් ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට ජල පාරිභෝගිකයින් කටයුතු කිරීම තුළ මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අතහැර දමා තිබුණි. | පානීය ජල අවශ්‍යතාවය සලකා බැලීමේදී මෙම ආයෝජන වල 100% ක් ප්‍රතිඵලදායී නොවන බව. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුකළ යුතු අතර ජල ටැංකි ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම හා කසළ එකතු කිරීම වෙනුවෙන් රු.3,752,571 ක ප්‍රාග්ධන වියදමක් හා රු.4,677,317 ක පුනරාවර්ථන වියදමක් දරා තිබුණද එම ව්‍යාපෘතිය අවසන් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. ඒ අනුව රැස්කරනු ලබන කසළවලින් කොම්පෝස්ට් නිෂ්පාදනය නොකරන අතර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ වල දැමීම සිදු කරන අතර රැස් කරනු ලබන ප්ලාස්ටික්, කාඩ්බෝඩ්, පොලිතින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ තාවකාලිකව ඉදිකර ඇති කසළ අංගනයේ ගබඩා කිරීම සිදුකර තිබුණි. | කොන්ත්‍රාත්තුවට අදාල ගිවිසුම අහෝසි කරන ලද අතර නැවත ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. ඉන් අනතුරුව විධිමත් පරිදි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත බව. | දිරන කසළ හා නොදිරන කසළ විධිමත්ව කළමනාකරණය කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| | | -- |
| සභා බලප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය කර විකිණීමේදී ඉඩම් කට්ටි 06 කට අදාළ අලෙවි වටිනාකමින් 1% ක බදු මුදලක් සභාව වෙත ලබාගත යුතු වුවත් විකුණුම් වටිනාකමට වඩා අඩු වටිනාකමක් තක්සේරු කිරීම නිසා රු.1,508,083 ක් සභාවට අහිමිකර තිබුණි. | වෙන්දේසි ආයතනවලින් අයවිය යුතු හිඟ බදු මුදල් අයකර ගැනීමට අදාල වෙන්දේසි ආයතන දැනුවත් කර ඇති බව. | විකුණුම් වටිනාකම අනුව 1% ක බදු මුදලක් අයකරගත යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂය තුළදී සභා අරමුදල් ප්‍රතිපාදන මඟින් සංවර්ධන ව්‍යාපෘති 29 ක් සඳහා රු.15,494,698 ක ගිවිසුම්ගතව තිබුණද රු.1,562,170 ක් වටිනා ව්‍යාපෘති 03 ක් ඉටුකර නොතිබුණි. | ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ සමාලෝචිත වර්ෂය තුළදී සභා අරමුදල් ප්‍රතිපාදන මඟින් සංවර්ධන ව්‍යාපෘති 29 ක් සඳහා අනුමැතිය ලැබුණු බව. | ගිවිසුම් ගත වූ ව්‍යාපෘති නියමිත කාල පරිච්ඡේදය තුළ ඉටු කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී වර්ෂය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අදාළව සත්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන පිරිවැය ඇස්තමේන්තු සකස් කර ඒ අනුව සැලසුම් සකස් නොකර නාමමාත්‍රික ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන තක්සේරු කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි. මේ නිසා සභාව විසින් සිදුකරනු ලබන සියළුම කාර්යයන් සඳහා කළමනාකරණ මෙවලමක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කර ගැනීමට නොහැකි වී තිබුණි. | අයවැය වාර්තාවට පෙර 2022 වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කර ඇති බැවින්, අයවැය වාර්තාව සකස් කිරීමේදී මන්ත්‍රීවරුන්ගෙන් ලබා ගන්නා සංවර්ධන යෝජනා 2022 වර්ෂයේ වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොමැත. එම නිසා වර්ෂය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අදාල ක්‍රියාකාරකම් වාර්ෂික සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු බව. | කර්මාන්ත අංශයේ සත්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒ අනුව පිරිවැය ඇස්තමේන්තු සකස් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |